**සංශෝධනයයි**

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

**ආධුනික ශිෂ්‍යභට නිලධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරිනි පුරප්පාඩු**

වර්ෂ 2024 ක් වූ ඔක්තෝබර් මස 25 දින අංක 2408 දරන *ගැසට්* පත්‍රයේ I කොටසේ (IIඅ) ඡෙදයේ පළ කරන ලද නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා පවතින පුරප්පාඩු පහත පරිදි සංශෝධනය වන අතර අනෙකුත් සුදුසුකම් සහ විස්තරයන් වෙනස් නොවන බව දන්වා සිටිමි.

**ඉවත් කිරීම**

**නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි)**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත් ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂයය ධාරාව/ ජීව විද්‍යා විෂයය ධාරාව (භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය) හෝ තාක්ෂණය විෂයය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය). එක් වරක දී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු යි.

**ඇතුළත් කිරීම**

**නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි/කාන්තා)**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත් ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉන් ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු ය. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂයය ධාරාව/ ජීව විද්‍යා විෂයය ධාරාව (භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය) හෝ තාක්ෂණය විෂයය ධාරාවෙන් (තාක්ෂණවේදය සඳහා විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස ඇතුළත්ව තිබිය යුතු ය). එක් වරක දී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතු යි.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශිෂ්‍ය නිලධාරි පුරප්පාඩු - ඉදුරාම බඳවාගැනීම්**

වර්ෂ 2024 ක් වූ ඔක්තෝබර් මස 25 දින අංක 2408 දරන *ගැසට්* පත්‍රයේ I වන කොටසේ (IIඅ) වන ඡෙදයේ පළ කරන ලද තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව සහ වෛද්‍ය ශාඛාව සඳහා පවතින පුරප්පාඩු පහත පරිදි සංශෝධනය වන අතර අනෙකුත් සුදුසුකම් සහ විස්තරයන් වෙනස් නොවන බව දන්වා සිටිමි.

**ඉවත් කිරීම**

**තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව**

**මෘදුකාංග ක්‍රම ලේඛක ඉංජිනේරු නිලධාරින් - පිරිමි/ කාන්තා (නිත්‍ය)**

පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව ඉංජිනේරු උපාධිය හෝ පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධිය හෝ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස අන්තර්ගත භෞතික විද්‍යාවේදී උපාධිය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාවක් (HNDIT) හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව ඩිප්ලෝමාවක් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පරිගණක සම්බන්ධ සාමාජිකත්වය (IESL) ලබා තිබීම හෝ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජිකත්වය (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සාමාජිකත්වය (ACS) ලබා තිබීම. මෘදුකාංග සංවර්ධන කුසලතා පිළිබඳව පළපුරුද්ද හෝ Java, C# or C/C++, HTML/ XHTML/ HTML 5, CSS3 (Cascade Styel Sheet), React JS, Angular JS, Ajax JavaScript, J Query, PHP, MySQL, ASP.NET, MSSQL, enterprise technologies (Such as Web services, APIs, XML, JSON, SSO, JMS) ,cloud technologies and container technologies (AWS, Azure and Docker), micro services, enterprise integration and API management පිළිබඳව පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**ඇතුළත් කිරීම**

**තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව**

**මෘදුකාංග ක්‍රම ලේඛන ඉංජිනේරු නිලධාරින් - පිරිමි / කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා - නිලඇඳුම් කාණ්ඩය/ නිල ඇඳුම් නොවන කාණ්ඩය)**

පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව ඉංජිනේරු උපාධිය හෝ පරිගණක හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධිය හෝ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස අන්තර්ගත භෞතික විද්‍යාවේදී උපාධිය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාවක් (HNDIT) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පරිගණක සම්බන්ධ සාමාජිකත්වය (IESL) ලබා තිබීම හෝ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජිකත්වය (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සාමාජිකත්වය (ACS) ලබා තිබීම. මෘදුකාංග සංවර්ධන කුසලතා පිළිබඳව පළපුරුද්ද හෝ Java, C# or C/C++, enterprise technologies (such as Web services, APIs, XML, JSON, Flutter, Node JS, MVC5), cloud technologies and container technologies (Such as AWS, Azure and Docker), micro services, enterprise integration, Data Base Administration, DevOps and API management පිළිබඳව පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**ඉවත් කිරීම**

**වෛද්‍ය ශාඛාව**

**කායික රෝග පිළිබඳ විශේෂඥ - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)**

(අ) කායික විද්‍යාව පිළිබඳ MD පශ්චාත් උපාධිය
(ආ) මණ්ඩලයේ සහතිකලත් විශේෂඥ වෛද්‍යවරයකු ලෙස SLMC ලියාපදිංචිය.

**ඇතුළත් කිරීම**

**වෛද්‍ය ශාඛාව**

**කායික රෝග පිළිබඳ විශේෂඥ - පිරිමි / කාන්තා (නිලඇඳුම් නොවන කාණ්ඩය - ස්වේච්ඡා)**

(අ) කායික විද්‍යාව පිළිබඳ MD පශ්චාත් උපාධිය
(ආ) මණ්ඩලයේ සහතිකලත් විශේෂඥ වෛද්‍යවරයකු ලෙස SLMC ලියාපදිංචිය.

**වී. බී. එදිරිසිංහ,**
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී
(සිව්වරක්), යූඑස්පී, එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී,
කිව්එච්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාපති